# විශේෂ නිවේදනයයි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වාගෙන යනු ලබන කිසිදු බාහිර උපාධි පාඨමාලාවක ඉගැන්වීමේ කටයුතු “IBA Campus” නමැති පෞද්ගලික ආයතනයකට පවරා නොමැති බව අවධාරණය කරමි.

එම ආයතනය විසින් සිසුන්ට යවා ඇති ලිපි හා රූපවාහිනී දැන්වීම්වලින් නොමග නොයන ලෙස සිසුන්ගෙන් ඉල්ලා සිටිමි.

සියලුම පාඨමාලාවල දේශන 2020 නොවැම්බර් මස විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යාමට මේ වනවිටත් සැලසුම් කර ඇත.

ඔබ පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීම් කර ඇත්තේ මෙම දේශන සඳහා නියමිත ගාස්තු ය. එහෙයින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වාගෙන යන කිසිදු බාහිර උපාධි පාඨමාලාවක අධ්‍යයන කටයුතු සඳහා පෞද්ගලික ආයතනවලට යාමේ අවශ්‍යතාවයක් නොමැති බව වැඩිදුරටත් අවධාරණය කිරීමට කැමැත්තෙමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඊ. දයාරත්න
අධ්‍යක්ෂ
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ